අරලියගහ මන්දිරයෙන්

"මෙන්න"

# ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

24 APR 2000

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

22-2-

කතෘ:-

ශාස්ත්‍රාචාර්ය එස්. ජී. සහබන්දු

විමසීම:-
එස්. ජී. සහබන්දු මහතා (බී. ඒ.)
176/A. එළියට පාර,
ගාල්ල.

දිනය::- 1988. 10. 30

# පෙරවදන

ප්‍රජාතන්ත්‍රික ලෙස පැවැත්වූ මහ මැතිවරණ වලින් ජයලබා ගෙන දීර්ඝ කාලයක් මේ රට පාලනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රට – ජාතිය – ආගම – දියුණු කිරීම සඳහා කළ වැඩ රාශියෙන් ඉතාම සුළු කොටසක් මෙ කුඩා ග්‍රන්ථ-යට ඇතුලත් කෙළෙමි.

විශේෂයෙන්ම මේ ග්‍රන්ථය සකස් කරන්නට අදහස් කෙළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අතීතය ගැන නොදත් තරුණ ඡන්ද දායක පිරිසට පක්ෂය පිළිබඳව සාමාන්‍ය දැනීමක් ලබාදීමේ පරම පවිත්‍ර චේතනාවෙන් බව මෙහිලා අවංකව සඳහන් කරමි.

මෙයට,
අවංක,
**එස්. ජී. සඟබන්ධු**
(කතෘ)

BKT 0104
25/08/2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

1951 සැප්තැම්බර් මස දෙවනිද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කළේ ශ්‍රී මත් එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරණායක උතුමාණෝය.

මෙම අභිනව දේශපාලන පක්ෂය බිහිකිරීමට අතිගරු බණ්ඩාරණායක අග්‍රාමාත්‍ය තුමා කල්පනා කළේ මේ රටේ දුක් විඳින සාමාන්‍ය මහජනතාව කෙරෙහි අනුකම්පාවෙන්ය.

1948 පෙබරවාරි හතර වෙනි දින ඉංග්‍රීසීන්ගෙන් මේ රටට ලැබුණ ඊනියා දේශපාලන නිදහස - ධනවත් - බලවත් - අධිරාජ්‍යවාදී - කළු ඉංග්‍රීසිකාරයන් අතලොස්සකට පමණක් සීමාවිය.

1948 වර්ෂයේ සිට 1951 වන තුරු පැවැති ආණ්ඩුවේ පලාත් පාලන ඇමතිවරයා වශයෙන් කටයුතු කළ අතිගරු බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සාමාන්‍ය මහජනතාවගේ නැතිවී ගිය අයිතිවාසිකම් ලබාදෙන ලෙස එම ආණ්ඩුවෙන් කීප වතාවක්ම ඉල්ලා සිටියහ. එම රජයේ නායක තුමා බණ්ඩාරනායක ඇමතිතුමාගේ ඉල්ලීම පිලිනොගත් නිසා එම රජයෙන් සහ ඇමැති ධූරයෙන් ඉල්ලා අස්වූ බණ්ඩාරනායක ශ්‍රීමතාණන් පොදු මහජනතාව වෙනුවෙන් — සාමාන්‍ය ජනතාවට සම්පූර්ණ නිදහස ලබාදීමේ එකම බලාපොරොත්තුවෙන් නිදහස් සමාජවාදී පාලන ක්‍රමයක් ඇතිකිරීමේ චේතනාවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටවූහ. නිල්පාටත් — අත ලකුණත් පක්ෂය හැඳින්වීමේ ජය ග්‍රාහී ලාංඡනයද තෝරා ගත්හ.

පක්ෂය ආරම්භ කරමින් කථාකළ බණ්ඩාරනායක උතුමාණන් තමාගේ අනාගත බලාපොරොත්තුව පැහැදිලිව — මහජනතාව ඉදිරියෙහි තැබූහ.

ගරු බණ්ඩාරනායක උතුමාගේ අවංක චතුර දේශනයන් කෙරෙහි විශ්වාසය තැබූ මෙරට බුද්ධිමත් — සඟ — වෙද — ගුරු — ගොවි කම්කරු — යන සෑම කොටස්වලටම අයත් පොදු මහජනතාව — 1956 වර්ෂයේදී පැවැත්වූ මහා මැතිවරණයේදී බණ්ඩාරනායක මහතාණන්ට අළුත් ආණ්ඩුවක් බිහිකිරීමට විශාල ඡන්ද බලයක් ලබාදුන්හ

1956 වර්ෂයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක බණ්ඩාරනායක උතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් නව රජයක් පිහිටුවා අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ භාරගත් බණ්ඩාරනායක උතුමාණන් තම අමාත්‍ය මණ්ඩලය සමග මහනුවර ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා මහජනතාවගේ ප්‍රශ්ණ විසඳීමේ මහා සංග්‍රාමය පටන් ගත්හ

තුන්ලෝකාග්‍ර — තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් අවුරුදු 2500 ක් සම්පූර්ණවීමේ බුද්ධ ජයන්තිය මහෝත්සවය ඉදිරියෙහි තිබියදී විශාල ජයග්‍රහනයක් කොට අග්‍රාමාත්‍ය පදවියට පත්වූ බන්ඩාරනායක උතුමාණන් බුද්ධ ජයන්ති උත්සවය ඉතාමත් උසස් ලෙස පැවැත්වූහ.

## සිංහලය රාජ්‍ය භාෂාව කිරීම:-

1815 වර්ෂයේදී ඉංග්‍රීසිකාරයන් මෙ රටෙ පාලනය අත්පත් කර ගැනීමේ සිට 1956 වන තුරුම ( බන්ඩාරනායක රජය පටන් ගන්නාතුරු ) සිංහල භාෂාව පසෙකට දමා ඉංග්‍රීසි භාෂාවෙන් මෙ රටේ සියලුම පාලන කටයුතු කරගෙන ගියහ

මෙසේ විදේශිය භාෂාවකින් රටෙ පාලන කටයුතු කරගෙන යාම පොදු මහජනතාවට බලවත් අසාධාරණයක් සිදුවූවා පමණක් නොව — මහත් අවාසියක් විය.

එපමණක් නොව සිංහලය රාජ්‍ය භාෂාව බවට පත් කරන ලෙස පොදු ජනතාව බොහෝ කලක සිටම පාලකයන්ගෙන් ඉල්ලා සිටියහ.

සිංහලය රාජ්‍ය භාෂාව බවට පත් කරණ බව මහ මැතිවරණයට පෙර බණ්ඩාරනායක උතුමාණන් මහ ජනතාවට පොරොන්දුවක් දී තිබිණ. යථෝක්ත පොරොන්දුව අනුව බණ්ඩාරනායක උතුමා සිංහල භාෂාව රාජ්‍ය පාලන ප්‍රධාන භාෂාව ලෙස සම්මත විය යුතු නිති රිති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කළහ.

රජයේ සියලුම කාර්‍යාලවල කටයුතු සිංහල භාෂාවෙන් කරන ලෙස නියෝග කළ අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක උතුමාණන් ඊට අවශ්‍ය සියලු විධි විධාන වහ වහාම යෙදූහ. මේ නිසා ශ්‍රී ලංකාවෙහි විශාල පරිවර්ථනයක් ඇතිවිය. මහජනතාව තුළ මහත් පිබිදීමක් ඇතිවිය.

තම මව් බසින් මෙන්ම තමන්ට වැටහෙන භාෂාවකින් රජයෙන් තමන්ගේ කටයුතු කරගැනිමට අවස්ථාව ලැබීම පොදු මහජනතාවට එතෙක් නොලැබී තිබුණු විශාල අයිතියක් ලැබීමක් විය.

## <u>නිලධාරි වාදයෙන් පොදු ජනයා නිදහස්වීම:—</u>

බ්‍රිතාන්‍යන්ට මෙරට යටත්ව තිබියදීත්, 1948 සිට 1956 වන තුරුත් සාමාන්‍ය මහජනතාවට රජයේ නිළධාරින්ගෙන් ලැබුණ තාඩන — පීඩන — ගෙරවිලි — පිප්පිලි — තර්ජන සහ මදි පුංචිකම් සියල්ලම අකුගා දමා ආත්ම ගෞරවය ඇතිව රජයේ කර්‍යාල වලින් තමන්ට අවශ්‍ය කටයුතු කරවාගෙන ජීවත්වීමටත් — සාධාරණව තම අයිතිවාසිකම් ලබා ගැනිමටත් අවස්ථාව ලැබුනේ බණ්ඩාරණායක අගමැතිතුමා නිසාය.

රජයේ නිලධාරින් ,මහජනයාගේ සේවකයන් බවත් — අගමැති වූවද තමාද මහජන සේවකයෙක් බවත් — ප්‍රථම වරට ප්‍රසිද්ධියේ කියා සිටි එකම අග්‍රාමාත්‍යවරයා මත් බණ්ඩාරනායක මහත්මාය.

ඔම් නිසා මේ රටෙ නිළධාරි වාදය නිලධාරින්ගේ හාමුදුරු නම නැතිවිය. සාමාන්‍ය පොදු මහජනතාවට නිලධාරින්ගෙන් — පහසුවෙන් තම කටයුතු කර ගැනිමට සෑම පහසුකමක්ම සැලසුන අතර — නිලධාරින් ඉදිරිපිට ඉඳ ගැනිමට ආයතනයක් පවා ලැබෙන්නට විය.

1956 වන තුරු බ්‍රිතාන්‍ය පාලකයන්ටත් සිංහල පාලකයන්ටත් නිලධාරින්ටත් බියෙන් තම අයිතිවාසිකම් ලබාගත නොහැකිව සිටි අසරණ පොදු ජනතාව බණ්ඩාරනායක පාලන යමයේ මහත් ප්‍රබෝධයකට පත්වූහ.

''නිදහස'' යනු කුමක්දැයි පැහැදිලි කල බණ්ඩාරනායක උතුමාණන් එම නිදහස භුක්ති විඳීමට — පොදු ජනතාවට — වැසී තිබුණ සියලු දොරවල් විවෘත කර දුන්හ.

## බස් ජනසතු කිරිම:—

මහජනතාවට ගමන් බිමන් යෑමට — ප්‍රමාණවත්වූ හෝ සුව පහසු කම් ඇති ගමනා ගමන සේවයක් එකල මෙරටෙහි නොතිබිණ. රටේ ප්‍රදේශ කිපයක පෞද්ගලික බස්රථ කීපයක් සහ සමාගම් කීපයක් බස් රථ - ටිකක් - මහා මාර්ග යදහටම නම නමන්ට - වෙන්කරගෙන ධාවනය කරවූහ. මේ බස් ධාවනය ජනතාවට ප්‍රමාණවත් නොවූවා පමණක් නොව ගමන් යෑමට තරම නුසුදුසු දිරාගිය කබල් බස්රථ රාශියකින්ද යුක්ත විය. එම දිරාගිය බස්රථවල බොහෝ විට පොල් පැටවූ ලෙස මහජනයාට තද බද වී යෑමටද සිදුවී තිබිණ. මෙසේ ධාවනය කරවූ මේ පෞද්ගලික බස්රථ බොහෝ විට අනතුරු වලට භාජනය වූ බවද දක්නට ලැබිණ. එකල හැටියට මෙ බස් කාරයෝ අධික ලෙස මෙන් ගාස්තුවක්ද ලබා ගත්හ.

බස් ජනසතු කරන ලෙස මහජනතාව කලක සිටම රජයෙන් ඉල්ලූහ. බස්රථ අයිතිකරුවන් එකල රජයේ සිටි මැති ඇමති වරුන්ගේ නෑදෑයෝ සහ හිත මිතුන් - ආධාරකරුවන් වූ නිසා 1948 - 1956 අතර රජයෙන් කිසිම ජනසතුවක් සිදු නොවීය.

මෙ අසහනයෙන් පොදු ජනතාව බේරාගැනීමටත් - සැප පහසු ගමනා ගමනයක් ලබාදීමටත් මැතිවරණ පොරොන්දුවක් ඉටුකිරීමටත් කල්පනා කල බණ්ඩාරනායක උතුමාණන් පාර්ලිමේන්තුවට බස් ජනසතු කිරීම පිළිබඳ නීති රීති ඇතුලත් පණත ඉදිරිපත් කොට සම්මත කරවා ලංකා ගමනා ගමන මණ්ඩලය පිහිටුවූහ.

මේ නිසා සාමාන්‍ය මහජනතාවට (ලක්ෂ සංඛ්‍යාත) ගමන් පහසුකම් ඇතිවිය. බස්රථ දහස් ගණනක් අළුතෙන් ගෙන්වූ අතර විශාල පිරිසකට රැකියාද ලැබිණ. සේවක පිරිසට වෘත්තිය අයිතිවාසිකම් ද ලැබිණ.

## වරාය ජනසතු කිරිම.

මෙ රට ඉංග්‍රීසින්ට යටත්ව තිබුණු කාලයේත් 1948 -1956 අතර කාලයේත් අපේ කොළඹ වරාය සමාගම් කීපයකට සහ පුද්ගලයන් (ධනවත්) ස්වසදෙනෙකුට අයත්ව තිබිණ. පිට රට වලින් රටට අවශ්‍ය බඩු ගෙන්වීමත් මෙරට බඩු පිට රටවලට පැටවීමත් - වරාය අයිතිකරගෙන තිබුණු පුද්ගලයන්ට සහ සමාගම් වලට අයිතිව තිබිණ. මෙම ඒකාධිකාරය නිසා පොදු මහජනතාවට අසාධාරණයක් මෙන්ම පොදු ජනයාට අලාභයක්ද රජයට ලැබිය යුතු විශාල ආදායමක් නොලැබී යාමක්ද සිදුවිය. වරාය සේවකයන්ටද කිසිම වෘත්තිය අයිතියක් ලබා ගැනිමට නුපුළුවන් විය.

මෙ අසාධාරණකම් - අපහසුකම් අලාභ නැතිකිරීමටත් ලෝක ප්‍රසිද්ධ කොළඹ වරායේ තත්වය දියුණු කිරීමටත් - සේවක අයිති වාසිකම් ලබාදීමත් පරමාර්ථ කොට ගරු බණ්ඩාරනායක අගමැතිතුමා කොළඹ වරාය ඇතුළුව ලංකාවේ සියලුම වරායයන් ජනසතු කිරීමෙ නීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරගෙන - වරාය සංස්ථාව පිහිටුවූහ.

ලෝක ප්‍රකට කොළඹ වරාය ජනසතු කිරීමෙන් බණ්ඩාරනායක උතුමාණන් මේ රටට සිදු කළේ උදාර සේවයකි. මෙරට ආර්ථිකය කෙරෙහි විශාල ලෙස බලපාන මේ මහා නැව් තොට (මහාකට) ජනතාවගේ දියුණුවට ධනය උපදින තැනකි.

වරාය සේවකයන් සහ අනෙකුත් ජනතාව බොහෝ කාලයක සිට බලාපොරොත්තු වූ මේ ජනසතු ව්‍යාපාරයද රටේ ප්‍රබෝධයට හේතුවිය.

## අර්ථසාධක අරමුදල්

යටත් විජිත සමයේ මෙරට - පෞද්ගලික සමාගම්වල සහ වෙනත් පුද්ගලික ආයතනවල සේවය කළ ලක්ෂ සංඛ්‍යාත සේවකයන්ට විශ්‍රාම යන්නට සිදුවී තිබුනේ හිස් අතින්ය. මේ නිසා ජීවිතයේ අවසාන භාගයේදී ඉතාම දුක සේ ජීවත්වීමට සිදුවී තිබිණ.

මේ කණගාටුදායක තත්වය ගැන කාරුණිකව කල්පනා කළ බණ්ඩාරනායක උතුමාණෝ අර්ථ සාධක අරමුදල් පිළිබඳ පණතක් පිළියෙළ කරවා එය පාර්ලිමේන්තුවෙන් සම්මත කොට පෞද්ගලික ආයතන වලින් විශ්‍රාම යන අයට විශාල මුදලක් ලබා ගැනීමට සියලු පිළි විධාන සැලැස්වූහ.

## කම්කරු නීති:

රජයේ හෝ පෞද්ගලික ආයතන වල සේවය කරන අය - ස්වාමි පක්ෂයට හිතුවක්කාර ලෙස ඇස්කර දැමීමට - යටත් විජිත යුගයේත් 1948 - 1956 අතර යුගයේත් බාධාවක් නොවීය. සේවකයන්ට සිදු වූ එම අසාධාරණකම් වලට විරෝ - ධය පෑමට හෝ නිතිමය ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට ඉඩකඩ නැතිවිය.

1956 දී අග්‍රාමාත්‍ය ධුරයට පත්වූ බණ්ඩාරනායක උතුමාණෝ කම්කරු - වන්ගේ වෘත්තිය අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි නීතිරීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කොට - වැඩ කරණ ජනතාවට විශාල සෙතක් සිදු කළහ. දවසකට වැඩ කළයුතු පැය ගණන - ගෙවිය යුතු වැටුප් ප්‍රමාණය දියයුතු නිවාඩු - අසාධාරණ ලෙස සේවකයන් පහ කිරීමට නොහැකිවන අන්දමේ ක්‍රියා මාර්ග යනාදි සහන ඇති කෙළේ බණ්ඩාරනායක උතුමාණෝය.

## සංස්කෘතික දෙපාර්තමේන්තුව:

දෙවන පෑ තිස් මහ රජතුමාගේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ඉංග්‍රීසි කාරයින්ගේ හිරකරුවෙක් බවට පත්වන තුරුම ආරක්ෂා වී තිබුණ සිංහල බෞද්ධයන්ගේ අයිතිවාසිකම් සහ බුද්ධ ශාසනයේ ආරක්ෂාවත් යටත් විජිත යුගයේ නැතිවී ගොස් තිබිණ.

1948 — 1956 අතර මේ රට පාලනය කළ ලාංකික අධිරාජ්‍ය වාදීන් ගෙන්ද සිංහල බෞද්ධයන්ට සහ භික්ෂූන් වහන්සේලාට අහිමිවී ගොස් තිබුණ බෞද්ධ උරුමය ලබා ගත නොහැකිවිය.

බෞද්ධයන්ගේ බලවත් ඉල්ලීම අනුව පත්කොට තිබුණ බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ වාර්තාවද එකල සිටි පාලකයන් හමස් පෙට්ටියටදමා තිබිණ.

1956 යේ මහ මැතිවරණ සමයේ යථෝක්ත බෞද්ධතොරතුරු පරීක්ෂක කමිටු වාර්තාවේ අඩංගු ඉල්ලීම් සපුරාදෙන බවට ප්‍රතිඥාදී තිබිණ, (ඒ අනුව). බණ්ඩාරනායක උතුමාණන් මෙ රටෙහි ප්‍රථම වරට සංස්කෘතික දෙපාර්තමේන්තු - වක් පිහිටුවා - සංස්කෘතික අමාත්‍ය ධුරයට ජයවීර කුරුප්පු මහතා පත් කරණු ලැබීය.

මෙ අමාත්‍යාංශය යටතෙහි බෞද්ධ භික්ෂූන් වහන්සේලාටත් - ගිහි බෞද්ධයන්ටත් - පාසැල්වල බුද්ධාගම ඉගැන්වීමටත් - දහම් පාසල් වලට නොමිලේ පොත් ලබාදීමටත් - ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමටත් - නටබුන් වී ගිය බෞද්ධ සිද්ධස්ථාන ප්‍රකෘතිමත් කරලීමටත් ධර්ම ප්‍රචාරක කටයුතු වලටත් විශාල වශයෙන් ආධාර සහ අනුබල ලැබිණ.

අනිකුත් ආගමිකයන්ට සාධාරණය ඉෂ්ට වූ අතර, බෞද්ධයන්ටත්, භික්ෂූන් වහන්සේලාටත් විශේෂයෙන්ම මහත් සෙතක් බණ්ඩාරනායක උතුමාණන්ගෙන් සැලසිණ.

1956 දී බුද්ධ ජයන්ති මහොත්සවය රාජකීය ආකාරයෙන් - රජයෙන් විශාල වියදමක් කොට සිංහල බණ්ඩාරනායක අගමැති තුමා - බුද්ධ ධර්මය ලොවපුරා පැතිරවීමේ බලාපොරොත්තුවෙන් ඉතා වැදගත් වැඩ පිළිවෙලක් ද ආරම්භ කළහ.

<u>බෞද්ධ විශ්ව විද්‍යාල ආරම්භ කිරීම.</u>

බුද්ධ ශාසනයේත් - සිංහල පාලි - සංස්කෘත භාෂාවන් - ආයුර්වේදයේත් - ජ්‍යොතිෂයේත් - භික්ෂූන් වහන්සේලාගේත් - ගොවිකම්කරු දරුවන්ගේත් දියුණුව සඳහා අතිශරු. බණ්ඩාරණායක උතුමාණන් ලක්දිව තිබුණු ඉපැරණි ශාස්ත්‍රායතන දෙක (විද්‍යෝදය - විද්‍යාලංකාර පිරිවෙන් දෙක) බෞද්ධ විශ්ව විද්‍යාල බවට පත් කළහ.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව හැටියට නීති ගතකළ බණ්ඩාරණායක අගමැති තුමා මේ මහා විද්‍යායතන දෙක විශ්ව විද්‍යාල බවට පත් කෙළේ ගොවි කම්කරු දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබාගෙන රජයේ උසස් නිලතල ලබා ගැනීමටය.

1656 දී බණ්ඩාරනායක රජය පිහිටුවන තුරු මේ රටේ තිබුණේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය නමැති එකම උසස් අධ්‍යාපන ආයතනයකි. එහි ඉගෙනීමට භාග්‍ය ලැබී තිබුණේ මෙරට ධනපතීන්ගේත් - මැති ඇමතිවරුන්ගේත් දරුවන්ට පමණය. භික්ෂූන් වහන්සේ නමකට හෝ සාමාන්‍ය ජනතාවගේ දරුවෙකුට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට අවසරයක් ලැබුණේ ඉතාම කලාතුරකිනි බණ්ඩාරනායක යුගයෙන් පසු මෙරට ගම්බද දරු - දැරියන්ට උසස් අධ්‍යාපන - යක් ලබා ගැනීමටත් රජයේ පරිපාලන කටයුතු වලට ඇතුල්වීමටත් - හෙලබසින් රාජ්‍ය පාලන කටයුතු මැනවින් කිරීමටත් අවස්ථාව ලැබිණ.

දුර්වලව තිබුණ දේශීය වෙදකම දියුණු කිරීමටත් - මෙරට ජනතාව හැම විටම අගය කොට සැලකූ ජ්‍යොතිෂය දියුණු කිරීමටත් යටපත්වී තිබුණු බෞද්ධ දහම් පාසැල් නගා සිටුවීමටත්. - බෞද්ධ සංස්කෘතිය නැවත ගොඩ නැංවීමටත් බණ්ඩාරණායක අගමැති තුමා පුළුල් වැඩ පිළිවෙලක් ආරම්භ කළහ.

බණ්ඩාරනායක උතුමාණන්ගේ හදිසි අභාවයෙන් එතුමාගේ උතුම් බලාපොරොත්තු බොහෝදුරට සුන්වී ගියේය.

<u>කුඹුරු පනත</u>

බොහෝ කාලයක සිට ඉඩම් හිමියන්ගේ මෙහෙකරුවන් ලෙස අපමණ හිරිහැර වලට මුහුණ පාමින් - තම ශ්‍රමයට සරිලන වේතනයක් හෝ අස්වැන්නෙන් කොටසක් නොලැබ අසරණව ජීවත්වූ අඳ ගොවීන්ට - සහනයක් ලාභයක් සාධාරණයක් - උසස් දිවි පෙවෙතක් ගෙන යාමට - හැකිවන පරිදි - අස්වැද්දන ගොවිතැන් වලින් සැහෙන අස්වැන්නක් අඳ ගොවීන්ට ලැබෙන ආකාරයටත් අඳ ගොවීන් අසාධාරණ ලෙස අස් කර දැමීමට නොහැකිවන පරිද්දෙනුත් නීති රීති සකස් කොට බණ්ඩාරනායක අගමැති තුමා කුඹුරු පණතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට නීති ගත කළහ. මෙයින් ගොවි ජනතාවට විශාල සෙතක් සැලසුනේය.

තම ආත්ම ගෞරවය රැකගෙන ජීවත් වන්නට පුළුවන් වාතාවරණයක් ඇතිවිය.

**වයස දහ අටේ තරුණ අයට ඡන්ද බලය:**

වයස අවුරුදු දහ අට සම්පූර්ණ වූ තරුණ තරුණියන්ට ඡන්දය දීමට හැකිවන පරිදි නීති රීති සම්මත කළේ බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමාය. තමන්ට ඡන්දය දීමේ ස්ථිර පුරවැසි බව ලබා දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක බණ්ඩාරනායක උතුමානන් බව මෙරට තරුණ ඡන්ද දායක පිරිස අමතක නොකළ යුතුය.

1956 දී ශ්‍රීමත් බණ්ඩාරනායක අගමැතිතුමා අභිනව ආණ්ඩුවක් පිහිටුවීමට පෙර මේ රටේ ඡන්ද බලය හිමිවූයේ වයස අවු 21 ට වැඩි අයට පමණයි.

දැනට රට පාලනය කරණ පක්ෂය දහ අටේ වයස් කරුවන්ට ඡන්ද බලය ලබාදීමට තරයේම විරුද්ධ වූහ. තරුණ අයට ඡන්ද බලය දීම - වඳුරන්ට දැලි පිහිය දීමක් බව කීහ. බණ්ඩාරනායක අගමැතිතුමා - විරුද්ධ වාදීන්ගේ තර්ක විතර්ක වලට නිසි පිළිතුරක් දෙමින් තරුණ අයට ඡන්ද බලය හිමිකර දුන්හ. මේ නිසා තරුණ අයට රජයේ උසස් නිලතල ලබාගැනීමටද හැකිවිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා වූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා මෙරටේ තරුණ අයට ලබාදුන් මේ ඓතිහාසික - වැදගත් වරප්‍රසාදය ගැන කෘතඥතාවෙන් යුක්තව සිහිපත් කළ යුතුය.

මේ රටේ උගත් තරුණ තරුණියන්ට ඡන්ද බලය ලබාදීමේදීත් - උසස් නිලතල වලට හිමිකම් ලබාදීමේදීත් දහසක් විරුද්ධකම් කළ ඇතැම් ධනවාදී අධිරාජ්‍යවාදී දේශපාලන පක්ෂ - අද තරුණ පිරිස - ජොබ් කාඩ් වලින් රවටා ගෙන නොමග යවා සත්‍ය වසන් කොට ඡන්දය උදුරා ගැනීමට නොයෙකුත් කූටෝපක්‍රම යොදා තිබෙන බව තරුණ පිරිස තේරුම් ගත යුතුය.

**පූර්ණ දේශපාලන නිදහස:**

1948 වර්ෂයේදී සම්මත කරගත් සෝල්බරී ආණ්ඩුක්‍රම පනත අනුව සර්වජන ඡන්දයෙන් පත්වූ මන්ත්‍රී වරුන්ගෙන් යුක්තවූ පාර්ලිමේන්තුවක් (ආණ්ඩුවක්) පිහිටවූ නමුත් එංගලන්ත රජයට යටත් බව ප්‍රකාශ කරමින් අගමැති මැති ඇමති සහ රජයේ සේවකයන්ට දිවුරන්ට සිදුවී තිබිණ.

එපමණක් නොව එංගලන්තයේ රැජින හෝ රජු වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයෙක් (අග්‍රාණ්ඩුකාර වරයෙක්) රාජ්‍ය නායකයා ලෙස පෙනී සිටියේය. යථෝක්ත ආණ්ඩුකාරවරයා ඉදිරියෙහි මෙරට සියළුම රාජ්‍ය සේවකයන්ද මැති ඇමතිවරුන්ද දිවුරුම් දුන්නේ "බ්‍රිතාන්‍ය රජයට යටත්ව කීකරුව සේවය කරන්නෙමි" යන වාක්‍යය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින්ය. ඉහත සඳහන් දිවුරීම අනුව අපට සම්පූර්ණ දේශපාලන නිදහසක් නොලැබුණු බවකියා සිටි බණ්ඩාරනායක උතුමා ශ්‍රී ලංකාවට පූර්ණ දේශපාලන නිදහස ලබා ගැනීමට අවශ්‍ය විධි විධාන යෙදූහ.

**කටුනායක සහ ත්‍රිකුණාමලයේ යුධ කඳවුරු:**

දෙවන ලෝක මහා යුද්ධයේදී ලංකා වාසීන් අධිරාජ්‍යවාදීන්ට පක්ෂව සිටි නිසා අපට තරමක දේශපාලන නිදහස් දුන් නමුත් අධිරාජ්‍යවාදීන්ගේ මහා යුධ කඳවුරු දෙකක් කටුනායක සහ ත්‍රිකුනාමලයේ තවදුරටත් පවත්වාගෙන

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

තිබුණ. මේ රටේ නිදහසට මේ යුධ කඳවුරු බලවත් තර්ජනයක් වූ අතර තැවත් මහා යුද්ධයක් ඇතිවුවහොත් මේ කඳවුරු නිසා අපටද භයානක අවි ආයුධ ප්‍රහාරයනට ගොදුරු වෙන්නට සිදුවී තිබිණ. සමහර විට මේ රටම යුද්ධ භූමියක් වන්නටද ඉඩ තිබිණ.

මේ සා විශාල ලෝකයෙහි සිංහලයන්ට උරුමවූ මේ එකම කුඩාරට දරුණු යුධ ආයුධ වලින් විනාශ වෙන්නට ඉඩ නොතබා සම්පූර්ණයෙන් නිදහස් කර ගැනීමට අධිෂ්ඨාන කළ බණ්ඩාරනායක උතුමාණෝ ත්‍රිකුණාමල සහ කටුනායක යුධ කඳවුරු අයිතිකරගෙන සිටි බ්‍රිතාන්‍ය සහ ඇමරිකන් රාජ්‍ය නායකයන් සමග සුහදව සාකච්ඡා කොට මේ ස්ථාන දෙකෙහි ගබඩා කරගෙන තිබුණ යුද්ධ ආයුධ ආපසු ගෙන යන්නට සැලැස්වූහ. කටුනායක නිදහස් කරගෙන එහි ලෝක ප්‍රකට අභ්‍යවකාශ ගුවන් තොටුපලක් විවෘත කළ බණ්ඩාරනායක අගමැතිතුමා ත්‍රිකුණාමල වරාය මේ රටට ඉතාමත්ම අවශ්‍ය මහා නැව් තොටක් බවට පත්කළහ.

මේ රටට සම්පූර්ණ ආරක්ෂාවත් දේශපාලන නිදහසත් ලබා ගැනීමට ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළ බණ්ඩාරනායක ශ්‍රීමතානන්ට උපහාරයක් වශයෙන් "බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල හැටියට ප්‍රසිද්ධියට පත්කොට තිබුණ මේ නාමය වර්තමාන පාලකයන්ගේ ඊර්ෂ්‍යාවට ලක්වීමෙන් කොළඹ ගුවන් තොටුපල - කටුනායක ගුවන් තොටුපල යන පෙරලිවලට පත්වී ඇත.

යටත්විජිත අධිරාජ්‍යවාදීන්ගේ ලංකා යුධ කඳවුරු දෙක අස්කර දැමීමෙන් මේ රටේ එල්ලවී තිබුණ භයානක තර්ජනයක් ඉවත්වූවා පමණක් නොව නිදහස් ලෝකයටම මහත් සැනසිල්ලක් ද විය. විශේෂයෙන්ම ආසියාතික (පෙරදිග) ලෝකයටම මේ කඳවුරු දුරු කිරීම සැනසිල්ලක් විය. මෙයින් ශ්‍රී ලංකාවත් බණ්ඩාරනායක නාමයත් ජාත්‍යන්තර කීර්තියටත් ගෞරවයටත් ලක්විය. නිදහස් ජාතීන් අතර එතෙක් ලංකාවට ලැබී තිබුණ පහත් තත්වය සමපත්වී උසස් තැනක් මේ රටට හිමිවෙන තැනට සියල්ල පිළියෙල විය.

## නොබැඳි පිළිවෙත

ලෝකයේ මහා බලවත් ජාතීන් සහ ඒ ජාතීන්ට ගැතිකම් දක්වන ජාතීන් අධිරාජ්‍යවාදීන් සහ සමාජ වාදී යන මහා පිල් දෙකට බෙදී ඇත. මේ පිල් දෙකටම සම්බන්ධ නැති නිදහස අගය කරන මැදහත් ජාතීන් (රටවල්ද) ද සියයකට වැඩිය ඇත.

බණ්ඩාරනායක අගමැති තුමාද නොබැඳි පිළිවෙත ගරු කළ ජන නායකයෙකු ලංකාව කිසිම බල කඳවුරකට (පිලකට) නොබැඳුන මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරන රටක් වශයෙන්ද, නොබැඳි ජාතීන් අතර පුරෝගාමී ජාතියක් වශයෙන්ද ලෝක ප්‍රසිද්ධියටත් කීර්තියටත් පත්වූයේ බණ්ඩාරනායක ශ්‍රීමතානන්ගේ විදේශ ප්‍රතිපත්තිය නිසාය.

දුර දර්ශී බුද්ධිමත් දේශපාලනඥයෙක්වූ බණ්ඩාරනායක අගමැති තුමා ලෝකයෙහි සියලුම රටවල් සමග තානාපති සම්බන්ධකම් ඇතිකරගත්හ. අධිරාජ්‍ය වාදී සමාජවාදී හා මධ්‍යස්ථ යන සෑම ලොකු කුඩා රටක් සමගම මිත්‍රකම් ඇතිකර ගත්හ. මෙම ජාත්‍යන්තර මිත්‍රකම නිසා ශ්‍රී ලංකාවට මහත් ප්‍රසිද්ධියක් කීර්තියක් මෙන්ම ආධාරද ලැබෙන්නට විය.

පංච සීල ප්‍රතිපත්ති අනුව රාජ්‍ය පාලන තන්ත්‍රය ක්‍රියාත්මක කළ අග්ගරු බණ්ඩාරනායක උතුමා ලෝකයේ මහා රාජ්‍යවල ජනනායකයන් අතර ප්‍රධාන ස්ථානයක සිට ශ්‍රී ලංකාවට මහත් ගෞරවයක් අත්පත් කර දුන්හ.

## මැයිදින නිවාඩු

ලෝකයේ වැඩකරන ජනතාවගේ සිහිකට යුතු උතුම් දිනයක් ලෙස සැලකෙන මැයි 01 වෙනිද රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් හැටියට නීති ගත කළේ බණ්ඩාරනායක උතුමාණන්ය. මැයි දිනය ලොව සෑම රටකම කම්කරු සමරු දිනයක් ලෙස ප්‍රසිද්ධ නිවාඩු දි ඇත. මෙ රටෙ 1956 වනතුරු තිබුණ ආණ්ඩුවෙන් මැයි දිනය නොසලකා හැර තිබුණ අතර, වෘත්තිය සමිතිවලට එදින අනුස්මරණ රැස්වීම් පැවැත්වීමට පවා අවහිර කර තිබුණ බව ප්‍රසිද්ධ කරුණකි.

වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ ඒකායන මාර්ගය ලෙස පවත්වාගෙන යන වෘත්තිය සමිති වලට සෑම පහසුකමක්ම සලසා දුන් බණ්ඩාරනායක අගමැතිතුමා කම්කරු ජනතාවට නිදහසත් ආරක්ෂාවත් මහත් සියට සරිලන වැටුපකුත් ලැබෙන හැටියට නීති රීති සකස් කළහ.

පසුගිය අවුරුදු 2500 ක පමණ කාලයක් තුල මෙ ශ්‍රී ලංකා ද්වීපයෙහි උපන් බුද්ධිමත් දූර දර්ශී මහා පඬිවරයන් අතර ප්‍රධාන ස්ථානයක් හිමිකර ගත් 1815 දි බ්‍රිතාන්‍යයන්ට මෙ රට යටත්වූවාට පසු මෙහි උපන් ශ්‍රේෂ්ඨතම දේශපාලඥයා වූ විසිවෙනි සියවසෙහි ලෝකයෙහි උපන් රාජ්‍ය නායකයන් ගෙන් කෙනෙක් වූ ලොව වතුර කපිකයන් අතර මුල් තැනක් ලබාගත් අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක උතුමාණන් උරුණාව, මෛත්‍රිය, මානව දයාව, යනාදි උතුම් මිනිස් ගුණාංගයන් ගෙන් යුත් මහා පුරුෂයෙක් බව එතුමාගේ ජීවන චරිතයෙන් පැහැදිලිවේ

තමන් උපන් මව්බිම වන ශ්‍රී ලංකාව අංග සම්පූර්ණ නිදහස් නිවහල් රටක් බවට පත්කිරීමටත් සෑම අංශයකින්ම පිරිහී තිබුණ රට, දැය, සමය, භාෂාව සාහිත්‍ය සහ මහජන ජීවන මාර්ගයත් නගා සිටුවීමටත් 1956 දි විශාල බලාපොරොත්තුවකින් කටයුතු ආරම්භ කළ බණ්ඩාරනායක අගමැතිතුමා මෙ රටේ නව යුගයක් උදාකලහ. වහල් හැඟිම වලින් යුක්ත අධිරාජ්‍යවාදි ධනවත් අතලොස්සක් පමණ කළු ඉංග්‍රීසි කාර පිරිසක් විසින් අත්පත් කරගෙන තිබුණ වරප්‍රසාද බිලතල තිලතල යන සම්පත් පොදු මහ ජනතාවටත් සමසේ බෙදී යන පරිදි පාලන තන්ත්‍රය ක්‍රියාත්මක කළ පොදු ජනනායක බණ්ඩාරනායක උතුමා කෙරෙහි වරප්‍රසාද ලත් ධනවත් බලවත් අධිරාජ්‍යවාදින් වෛර බැඳගත් අතර අතිශයින්ම තීක්ෂණ කුමන්ත්‍රණයක් මගින් එතුමාගේ ජීවිතය විනාශකර දැමූහ.

බණ්ඩාරනායක අගමැතිතුමා මරාදැමීමෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මරා දැමීමට කුමන්ත්‍රණකරුවෝ බලාපොරොත්තු වූහ. කුමන්ත්‍රණකාරී ද්‍රෝහීන්ගේ අදහස් සඵල නොවිය.

## ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය ගත්හ.

ලෝකයේ ප්‍රථම අගමැතිවරිය වශයෙන් ලෝක ප්‍රකට කීර්තියක් ඇතිකර ගත් උතුම් බෞද්ධ මාතාවක් වූ ගරු අගමැතිණිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පොදු ජනතාවගේ උරුමයෙනුත් ආරක්ෂා කරමින් පාලන කටයුතු ඇරඹුහ.

බණ්ඩාරනායක මැතිණිය බලයට පත්වීම නිසා කුපිත වූ කුමන්ත්‍රණකරුවෝ මැතිණියගේ ආණ්ඩුව බිඳ දැමීමට කුමන්ත්‍රණ කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර ඇමති පිරිසක් මුදල් බලයෙන් මැතිණියගේ රජයෙන් අය්කරවා ගත්හ. එයින් ඉනානැවතුන කුමන්ත්‍රණකරුවෝ මැතිණියත් දරුවනුත් මරා දමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් බණ්ඩාරනායක පාලන ක්‍රමයත් විනාශ කර දැමීමට හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් පිරිසක් සම්බන්ධ කරගෙන ඉතාම දරුණු කුමන්ත්‍රණයක් කළහ. ඉහත සඳහන් කුමන්ත්‍රණය අසාර්ථක වී බරපතල දඬුවම් වින්ද කුමන්ත්‍රණකරුවෝ නැවතත් 1971 දී බණ්ඩාරනායක මැතිණියගේ රජය බිඳ හෙළීමට ත්‍රස්තවාදී වැඩ පිළිවෙලක් (කැරැල්ලක්) ඇති කළහ.

මේ රටේ බලලෝභී ධනවාදී අධිරාජ්‍යවාදී පුද්ගලයන් අනලොස්සක් දිගින් දිගටම තම කණ්ඩායමේ බලතල රැකගැනීමේ එකම චේතනාවෙන් කුමන්ත්‍රණ කරමින් පොදු ජන හිතකාමී ජනනායකයන් ඝාතනය කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයතුල භේද ඇතිකරවමින් අවංක අසරණ බෞද්ධ ජනතාවට බොරු පොරොන්දු වෙමින් කපටි කථාවලින් රවටමින් වරින් වර රාජ්‍ය පාලන බලතල ලබා ගනිමින් මුළු ලෝකයේම අප්‍රසාදයට ලක්වන අධර්මිෂ්ඨ ක්‍රියාවල යෙදෙති. රටත් ජනතාවත් ධනවත් රටවලට උගස් කොට කෝටි සංඛ්‍යාත මුදල් ලබාගෙන මහා ඉහළින් වැජඹෙණ මේ කුමන්ත්‍රණකාරී ජාති ද්‍රෝහීන් ගැන බුද්ධිමත් ජනතාව නිතර කල්පනාවෙන් සිටිය යුතුය.

ශ්‍රීමත් බණ්ඩාරනායක උතුමාණන් ඒ මාරක වෙඩි පහරට මුහුණ පෑවේ මේ රටේ පීඩිත පන්තියට - පොදු ජනතාවට විමුක්තිය ලබාදීමට උත්සාහ කළ නිසාය. සාමාන්‍ය ජනතාවගේ අයිතිවාසිකම් නැවත ලබාදීමට ක්‍රියා කළ නිසාය.

බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමාගේ පොදුජන හිතකාමී ප්‍රතිපත්ති වලින් ජනසතු ව්‍යාපාර වලින් - සෙල බස රජ බස වීමෙන් - පහර වැදුන - රිදුන- අධිරාජ්‍ය වාදී ධනවාදී දේශ ද්‍රෝහීන් බණ්ඩාරනායක ඝාතනයේ සිට අද වන තුරුත් ඉතා සියුම කූට උපක්‍රම යොදමින් බණ්ඩාරනායක නාමයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සම්පූර්ණයෙන්ම නැතිකර දැමීමට ක්‍රියාකරන බව පසුගිය කාලපරිච්ඡේදයේ මේ රටේ පාලනයෙන් පැහැදිලි වේ.

බණ්ඩාරනායක යුගයේ පොදු මහජනතාවට ලැබී තිබුණ වරප්‍රසාද සහන අයිතිවාසිකම් සියල්ලක්ම දැනට ධනවතුන් බලවතුන් පැහැරගෙන තිබෙන බව ඡන්ද දායක භවතුන්ට අවබෝධ විය යුතුය.

මැතිණිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත්වීම.

දුක් විඳින පොදු මහජනතාවට සේවය කිරීමට ඇප කැපවී සිටියදී සාමාන්‍ය ජනතාව වෙනුවෙන් තම වටිනා ජීවිතය පරිත්‍යාගකල උතුම් ගතිගුණ වලින් පිරුණු උදාර හදවතක් ඇති ශ්‍රේෂ්ඨ චරිතාපදානයකින් යුත් ලෝක ජාතියක ඉතා කලාතුරකින් පහල වන දුර්ලභ ගනයේ මනුෂ්‍ය රත්නයක් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක ශ්‍රී ලංකාවේ මහජන නායක ශ්‍රීමත් බන්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමාගේ හදිසි අභාවයෙන් සිදුවූ පිරිමැසිය නොහැකි පාඩුව සපුරා දීමේ පරමාධ්‍යාශ ගරු සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාරගත්හ.

මේ රටේ බුද්ධිමත් මහජනතාවගේ බලවත් ඉල්ලීමක් බන්ඩාරනායක උතුමාණන් ආරම්භ කළ මහජන විමුක්ති වැඩ පිළිවෙලක් ගැන කල්පනා කළ ගරු බණ්ඩාරනායක මැතිනිය පක්ෂයේ නායකත්වය භාර ගෙන 1960 වර්ෂයේදී ප්‍රථම වරට අතිගරු අග්‍රාමාත්‍ය ධුරයට පත්වූවාය.

ලංකාවෙහි පමණක් නොව මුළු ලෝකයේම ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වශයෙන් බණ්ඩාරණායක මැතිණිය ලෝක ඉතිහාසයෙහි සිය කීර්ති නාමය ලියවා තැබුවාය.

''ශ්‍රී ලංකා'' යන නමත් ''බණ්ඩාරනායක'' නමත් එතුමිය නිසා තුදු නවත් ලෝකප්‍රකට විය.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමිය 1960 සිට 1965 දක්වාත් 1970 සිට 1977 දක්වාත් අවුරුදු 12 ක පමණ කාලයක් ශ්‍රී ලංකාවෙහි අගමැති ධුරය දැරිය. මෙතරම් දීර්ඝ කාලයක් මෙ රටේ අගමැතිකම කළ කිසිවකු නොවිය.

එපමණක් නොව ලෝකයේ මුළු ජනගහණයෙන් 2/3 ක් පමණ නියෝජනය කරන මධ්‍යස්ථ ජාතීන්ගේ (නොබැඳි ජාතීන්ගේ) මහා සංවිධානයෙහි (සභාපති) නායිකාව වශයෙන්ද ගරු අග්‍රාමාත්‍ය වරිය ක්‍රියා කළාය.

මෙ අතින් ගරු බණ්ඩාරනායක අගමැතිණිය විශිෂ්ඨ වාර්තා ගණනාවක් පිහිටවූ අතර ශ්‍රී ලංකාවට මිළ කළ නොහැකි මහත් කීර්තියක් අත්කර දුන්හ.

ශ්‍රී ලංකාවෙහි පරම්පරාගත උතුම් බෞද්ධ කාන්තාවක් වශයෙන් ලෝක නායකත්වයට පත්වූ බණ්ඩාරනායක මැතිණියගෙන් අප රටට අත්වූ ගෞරවය මෙතෙකැයි සීමා කළ නොහැකිය.

## 1960 - 1965 කාල පරිච්ඡේදය.

ප්‍රථම වරට අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ භාරගත් ගරු බණ්ඩාරනායක මැතිණිය දිවංගත බණ්ඩාරනායක උතුමාණන් ඇරඹූ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රතිපත්ති මත ශ්‍රී ලංකාව ගොඩනැගීමේ මහා භාරදූර කටයුත්තට අත තැබූවාය.

## ග්‍රාමසේවක නිලධාරීන් පත් කිරීම.

ගම්බද ගොවි කම්කරු අහිංසක මහජනතාවගේ දියුණුවට බාධා කරමින් ගම් වැසියන් මුලා කරමින් ගම් වැසියන්ට අනායෙක් තාඩන පීඩන කරමින් අසාධාරණ ලෙස අහිංසකයන් නඩු හබ වලට පවා පටලවමින් ගම්මුලාදෑනි කම් කළවුන්ගේ ග්‍රහනයෙන් ගමවැසි ජනතාව නිදහස් කරගනිමින් ගරු බණ්ඩාරනායක මැතිණිය ප්‍රථම වරට මෙරටේ ග්‍රාමසේවක නිලධාරී ක්‍රමය ඇතිකළහ

උගත් තරුණයන් ග්‍රාමසේවකවරුන් වශයෙන් පත්වීම් ලබාගෙන ගැමි ජනතාවගේ ප්‍රශ්ණ වලට කාරුණිකව සවන් දී තම සේවය මැනවින් කරන්ට පටන් ගත්හ. ග්‍රාමසේවක ක්‍රමය නිසා සාමාන්‍ය ගැමි ජනතාවට මහත් පසතක් සිදුවිය.

## මහජන බැංකු සහ ග්‍රාමීය බැංකු පිහිටුවීම.

ලංකාවේ බැංකු ආරම්භ කොට බොහෝ කලක් ගතවී තිබුණ නමුත් සාමාන්‍ය ජනතාවට ඒ ගැන කිසිදු දැනුමක් නොතිබුණි. තමන් සතු මුදලක් සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමක් තම මුදල් වල පොලිය වශයෙන් වැඩි කර ගැනීමටත් නොදැන සිටියහ.

බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ අනුමැතිය ඇතිව එවකට සිටි මුදල් ඇමතිතුමා මහජන බැංකු ආරම්භ කොට එම බැංකු ශාඛා රටේ සැම ප්‍රදේශයකම පිහිටවූහ.

ඒ සමගම මේ රටේ ගොවි ජනතාවට විශේෂ සේවයක් වශයෙන් ගොවි කටයුතු වලට ණයට මුදල් ලබා ගැනීමටත් මුදල් ගනුදෙනු පහසුවෙන් කර කියා ගැනීමටත් ඉඩකඩ සලසමින් ග්‍රාමීය බැංකු ගම්බද ප්‍රදේශවල පිහිටවූහ.

විවිධ සේවා සමුපකාර සමිතිවලට සම්බන්ධ කොට ග්‍රාමීය බැංකු පිහිටුවීම නිසා ගම්බද ගොවි ජනතාවට මෙයින් අද විශාල යහපතක් සිදුවී ඇත.

කෘෂිකර්ම කාර්යාල සහ ලංකා බැංකු ශාඛා පිහිටුවීම.

කෘෂිකාර්මික රටක් වශයෙන් ප්‍රසිද්ධියක් ඇති ශ්‍රී ලංකාවෙහි ජනතාවගේ ප්‍රධාන ආහාරය වන බත (සහල්) වැඩි වැඩියෙන් නිෂ්පාදනය කරවීමේ බලාපොරොත්තුවෙන් ගොවිජනතාවට බිත්තරවී - පොහොර - ණය මුදල් ලබා ගැනීමටත් - රජයට සාධාරණ මිළකට වී ලබා ගැනීමටත් බලාපොරොත්තුවෙන් ගරු අගමැතිණිය සෑම මැතිවරණ කොට්ඨාශයකම කෘෂිකාර්මික කාර්යාලය බැගින් පිහිටවූහ. එම කාර්යාලවලම කොටසක ලංකා බැංකු කාර්යාලය බැගින් ද විවෘත කළහ. මෙම පහසුකම නිසා මෙරට කෘෂිකර්මය වේගයෙන් දියුණු වෙන්නට පටන් ගත්තවත් - ගම්බද ගොවිජනතාව වැඩි වැඩියෙන් බැංකු වල මුදල් තැන්පත් කරන්නටත් පුරුදු වූහ.

පාසල් රජයට පවරා ගැනීම;

අවුරුදු දහස් ගණනක් මේ රටේ පැවත ආවේ නිදහස් අධ්‍යාපනයයි. යටත් විජිත සමයේ අධ්‍යාපනය මුදලට ගන්නට සිදුවිය.

ඉංග්‍රීසීන්ට මේ රට යටත් වූවාට පසු මිෂනාරි ආගමික ආයතන මඟින් පාසල් පවත්වා ගෙන යන්නට පටන් ගත්හ. මේ අනුව සංවිධානයවූ බෞද්ධ සමාගම්ද ධනවත් පුද්ගලයන්ද ව්‍යාපාරයක් ජාවාරමක් වශයෙන් මුදල් ගරා ගැනීමට පාසල් පවත්වාගෙන ගිය බව පැහැදිලිය. මේ පාසල් කළමනාකරුවෝ ශිෂ්‍යයන්ගෙන් මාස්පතා මුදල් අයකර ගත් අතර රජයෙන්ද ආධාර (ග්‍රාන්ට්) මුදල් ලබාගත්හ. මේ කොම්පැනි පාසල් වලින් කළේ ඉංග්‍රීසින්ගේ පාලනය කරගෙන යාමට අවශ්‍ය ලිපිකරු ආදී තනතුරු වලට ප්‍රමාණවත් ඉගැන්වීමකි.

එපමනක් නොව එම පෞද්ගලික ආයතනවල අධ්‍යාපන ක්‍රමද විවිධ තරාතිරම වලින් යුක්ත විය. මෙයින් සමාජය උසස් පහත් භේද වලින්ද භේද භින්නවී තිබිණ.

ඇතැම් පාඨශාලාවල ඉගෙනගත් අයට රජයේ උසස් තනතුරු නොලැබිණ උසස් යයි සම්මත විද්‍යාලවල ඉගෙනගත් අයට රටේ සෑම අංශයකම වරප්‍රසාද ලබාගත හැකිවී තිබිණ. සාමාන්‍ය ගොවිකම්කරු දරුවන්ට උසස් අධ්‍යාපනයක්වත් උසස් තනතුරක්වත් ලබාගන්නට කිසිසේත්ම අපහසු විය.

මේ අසාධාරණය නැතිකොට දක්‍ෂකම් ඇති ඕනෑම දරුවකුට උසස් අධ්‍යාපනයක් ලබාගැනීමටත් රජයේ උසස් නිලතලයක් ලබාගැනීමටත් අවස්ථාව සලසා දෙමින් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය පෞද්ගලික සියලුම පාසල් රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතට පත් කළහ.

මේ පාසල් රජයට ගැනීම නිසා සාමාන්‍ය සමාජය තුල විශාල ප්‍රබෝධයක් ඇතිවිය. ගැමි දරුවන්ටද උසස් පාසල් වලට ඇතුල්වී - උසස් අධ්‍යාපනයක් ලබාගෙන - රටේ උසස් තනතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසිණ.

## විදේශිය තෙල් සමාගම් ජාතිය සතු කිරීම:

1948 දී මෙරටට ලැබුණාය කියන ඊනියා අර්ධ දේශපාලන නිදහසින් පසු 1960 වනතුරුත් මේ රටේ දියුණුවට ලැබිය යුතු ජාතික ධනය - ධනවාදී අධිරාජ්‍යවාදී විදේශවලට ඇදීයාම දිගින් දිගටම සිදුවිය. රටේ සංවර්ධනයට මෙය මහත් බාධාවක් විය.

විශාල වශයෙන් අපේ ධනය පිටරට වලට ගලාගිය ප්‍රධාන මාර්ගයක් වූයේ ඇමරිකාවට සහ එංගලන්තයට අයිති ෂෙල් සහ කෙල්ටැක්ස් යන බනිජ තෙල් සමාගමය. මේ රටේ පැට්‍රල් ඩීසල් ලාම්පුතෙල් සහ තවත් ලිහිස්සි තෙල් මෙහි ගෙන්වූයේත් බෙදාහැරියේත් යථෝක්ත විදේශිය සමාගමය. එයින් ලැබුණු මුදල් කෙලින්ම ධනවත් රටවලට යැවිය.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 1960 - 1965 අවුරුදුවල අග්‍රාමාත්‍ය ධුරය දැරූ කාලයේ යථෝක්ත තෙල් සමාගම් වලට අයිතිව මේ රටේ තිබුණ දේපල සහිතව ජනසතු කළහ.

මෙම ජනසතු ව්‍යාපාරයෙන් පමණක් අද මේ රටට ලැබෙන ලාභය ඉතා විශාලය.

දැනට ලොව පුරා තදින්ම බලපා තිබෙන බලශක්ති අර්බුදය ගැන සලකා බලන විට - මෙරට තෙල් වෙළඳාම පිටරටියන් අත රැඳී තිබුණා නම් රටේ පාලනය තෙල් කොම්පැණිකාරයන් අතට පත්වන්නට ඉඩ තිබිණි.

## නැව් සංස්ථාව පිහිටුවීම;

මෙරට අපනයන ආයතන කටයුතු සඳහා අපේම නැව් නොතිබීම නිසා අපට විදේශිය නැව් සමාගම් වලට අවුරුදු පතා විශාල මුදලක් ගෙවීමට සිදුව තිබිණ.

අපේ තේ රබර් ආදී වෙළඳ ද්‍රව්‍යයන් විදේශවලට ගෙන ගොස් විකිණීමටත් විදේශ වලින් අප රටට අවශ්‍ය ද්‍රව්‍යයන් ගෙන ඒමටත් අපේම නැව් යොදවන්නට හැකිවූයේ බණ්ඩාරනායක මැතිනියගේ දූර දර්ශි ක්‍රියාමාර්ගයන් නිසාය.

ගරු බණ්ඩාරනායක අගමැතිණිය ශ්‍රී ලංකා නැව් සංස්ථාව ආරම්භ කොට එතුමියගේ පාලන කාලය තුල නැව් අටක් මිළදී ගත්හ. මේ නිසා ලංකාවට විශාල ලාභයක් සහ ප්‍රසිද්ධියක් අත්පත් විය. අපේ ජාතික කොඩිය ලෙල දෙන - ලංකාවට අයත් වෙළඳ නැව් ලොවපුරා බඩු විකුණමින් යාත්‍රා කරන්නට පටන් ගත්තේ බණ්ඩාරනායක පාලන යුගයේය.

විදේශීය නැව් වලින් අපේ වෙළඳ කටයුතු කරද්දී ප්‍රවාහන කටයුතු වලටත් ප්‍රමාද ගාස්තු වශයෙනුත් රුපියල් ලක්ෂ ගණන් අපේ ජාතික ධනයෙන් පිටරට වලට ඇදී ගියේය. අපේ රටේ දියුණුවට අවශ්‍යවූ ධනය පිටරට වලට ඇදීයාම බලවත් පාඩුවක් විය.

අපේ රටේ ආර්ථිකය කෙරෙහි විශාල ලෙස බලපා තිබෙන වෙළඳ නැව් කීපයක් නමුත් අප ජාතියට අයිතිකරදීම ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණියගෙන් මේ රටට සිදුවූ වැදගත්ම සේවයක් බව කිවයුතුය.

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව;

බොහෝ කාලයක සිට මේ රටේ රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන ගියේ පෞද්ගලික සමාගම් වලින්ය. මේ පුද්ගලික සමාගම් පවත්වාගෙන ගියේ පොදු මහජනයාගේ යහපතට වඩා සමාගම් කරුවන්ගේ ධනවත්කම් තරකරගැනීමේ බලාපොරොත්තුවෙන්ය. මෙසේ දිගින් දිගටම පොදු ජනතාවගේ ධනය අතලොස්සකට සූරා කෑමට ඉඩදීම මහත් අසාධාරණයක් බව තේරුම්ගත් ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය අගමැති ධුරය දරද්දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිහිටවූහ.

මෙයින් ලක්ෂ සංඛ්‍යාත පොදු ජනතාවට යහපතක් සැලසී ඇත.

## මහා රෙදි කම්හල් ආරම්භ කිරීම;

මෙරට ජනතාවට අතිශය නරම් ඉතාම හොඳ රෙදි පිළි මෙ රටේම නිෂ්පාදනය කිරීමෙන් පිටරට වලට ඇදී යන මහා ධනස්කන්ධය ඉතිරිකර ගැනීමේ උතුම් අදහස පෙරදැරි කරගත් ගරු අග්‍රාමාත්‍යා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විශාල රෙදිකම්හල් කීපයක් මෙ රටෙහි පිහිටවූහ. වේයන්ගොඩ, පූගොඩ, තුල්හිරියා ආදි ස්ථානවල පිහිටවූ මෙ රෙදි කම්හල් පෙරදිග ලෝකයේ තිබෙන විශාලම ආයතනයි.

එපමණක් නොව සෑම පාර්ලිමේන්තු ආසන වලම බලවේග රෙදිකම්හල් ඇති කළහ. තවදුරටත් ලක්දිව රෙදි නිෂ්පාදනය දියුණු කිරීමට ගෙයක් ගෙයක් පාසා අතින් ක්‍රියා කරන රෙදි වියන යන්ත්‍ර තබා ගැනීමට මැතිණියගේ රජය සෑම පහසුකමක්ම සපයා දුන්හ.

මෙයින් මේ රට රෙදි පිළි වලින් ස්වයංපෝෂිත වෙන්නට පටන් ගත් අතර දස දහස් ගණනක් තරුණ අයගේ රැකියා ප්‍රශ්ණ විසඳුන අතර පිටරටට ඇදීගිය කෝටි ගණන් මුදල් මෙ රටේම රැඳින.

## ආයුර්වේද පර්යේෂණායතනය:

මෙරට සිංහල රාජ්‍ය සමයේ ඉතා දියුණු තත්වයක පැවතුන දේශීය වෙදකම (ආයුර්වේදය) යටත් විජිත යුගයේදී අන්තපරිහානියට පත්ව තිබී නැවතත් ශ්‍රීමත් බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී පුනර්ජීවයක් ලබන්නට විය.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය අග්‍රාමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු දේශීය වෙදකම තව තවත් දියුණු කිරීමට අතිශය විධිවිධාන යැලැස්වූ අතර දේශීය ඖෂධ සහ රෝගීන් පරීක්ෂා කිරීමට නාවින්නෙහි ආයුර්වේද පර්යේෂනායතනයක්ද විවෘත කළහ. ඉකුත් අවුරුදු දෙදහස් පන්සියකට අධික කාලය තුල ලංකාවේ පිහිටවූ එකම ආයුර්වේද පර්යේෂන ආයතනය මෙ බව සඳහන් කළ හැක.

## කිරිපිටි කම්හල:

විශේෂයෙන්ම මෙ රටේ ළදරුවන්ගේ යහපත සඳහා ළදරු කිරිපිටි වැඩි වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත් හැකිතාක් අඩු මිළකටත් මහජනයාට කිරි ලබදීමේ චේතනාවෙන් ගරු සිරිමාවෝ බණ්ඩාරනයක අග්‍රාමාත්‍ය තුමිය කිරිපිටි කර්මාන්ත ශාලාවක් පිහිටවූහ. මෙ රටට අවශ්‍ය කරම කිරි ආහාර එම කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කළ අතර ලක්ස්ප්‍රේ රාත්තල රුපියල් 4. 50කට මහජනයාට ලබා ගන්නට හැකිවිය. වර්තමාන පාලනය පටන්

ගත් පසු කිරිපිටි වර්ග අධික මිලට පිටරටවලින් ගෙන්වන්නට පටන්ගත් අතර අපේ කිරිපිටි කර්මාන්ත ශාලාව ජාතිද්‍රෝහියෝ ගිණිබත් කළහ. මේ ජාතික අපරාධය කළවුන්ට අදවන තුරුත් හඩුත් නැත. දඩුවනුත් නැත.

**උකුකිරි කම්හල:**

ලංකාවාසී සාමාන්‍ය මහජනතාවට උදේට අඩු මිළකට කිරි ටිකක් පානය කිරීමට අවස්ථාව සලසා දීමට අදහස් කළ ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය මින්නේරිය ප්‍රදේශයේ උකුකිරි කර්මාන්ත ශාලාවක් යාදවා විවෘත කළහ.

**කැලණියේ ටයර් කර්මාන්ත ශාලාව:**

බොහෝ කාලයක සිට ලංකාවේ රබර් පිටරටියෝ අඩුමිළකට ගෙන ගොස් ටයර් නිෂ්පාදනය කොට නැවත අප රටට වික්කේ අධික මිළකටය.

මේ විදියට අපේ ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය වල ප්‍රයෝජනය විදේශිකයන්ට පැහැර ගැනීමට ඉඩදීම බලවත් පාඩුවක් බව කල්පනා කළ බණ්ඩාරනායක අගමැතිණිය සෝවියට සමූහාණ්ඩුව සමග සාකච්ඡා කොට පරිත්‍යාගයක් වශයෙන් ලබාගත් කැලණියේ මහා ටයර් කම්හල ආරම්භ කළහ. වර්තමාන පාලකයෝ මේ ජාතික සම්පත - රුසියාවෙන් ලැබුණු පරිත්‍යාගය දැනට ඇමරිකන් ටයර් සමාගමකට පවරා දී ඇත.

**ඔරුවල වානේ කම්හල:**

ගොවි කාර්මික රටක් වන ලංකාවෙහි ගොවි කම්කරු ජනතාවට ඉතාමත් අවශ්‍ය උදලු, කැති, පොරෝ ආදි උපකරණ සදාකල්හිම විදේශ වලින් අධික මිළට ගෙන්වීමෙන් වසරක් පාසා පිටරට වලට ඇදී යන විශාල ධනය මේ රටේ රඳවා ගැනීමත් - විශාල ජනතාවකට සහනදායක ලෙස ගොවි උපකරණ සපයා දීමත් - තවත් දහස් ගණනකට රැකියා සපයාදීමත් පරමාර්ථ කොට ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැති තුමිය තම පාලන සමය තුලදී ඔරුවල වානේ කර්මාන්ත ශාලාව ආරම්භ කළහ. මෙයින් මෙකල රටට විශාල ලාභයක් අත්පත් වෙයි.

**ඛනිජ තෙල් පිරිපහදුව;**

පැට්‍රල් ආදී සෑම ඛනිජ තෙල්වලම මිළ දිනෙන් දිනම වැඩිවෙන්නට පටන්ගත් නිසාත් පිරිසිදු කරපු තෙල් මේ රටට ගෙන්වීම විශාල ධන හානිය යක් වන නිසාත් ශුද්ධ නොකළ (බොරතෙල්) තෙල් මෙරටට ඉතා අඩු මිළකට ගෙන්වා මේ රටේදීම පිරිසිදුකොට බෙදා හැරීමට කල්පනා කළ ගරු බණ්ඩාරනායක මැතිණියගේ රජය ඛනිජ තෙල් පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවක් සපුගස්කන්දේ පිහිටවූහ.

**කර්මාන්ත නගරයක්,**

මේ රටේ ජනතාවට නිතර පාවිච්චිය සඳහා අවශ්‍ය සපත්තු බෑග් ආදි භාණ්ඩ රාශියක් නිෂ්පාදනය කරන ක්‍රීඩා කර්මාන්ත නගරයක් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ රජයෙන් මීගමු ප්‍රදේශයේ ඒකල නම් ස්ථානයෙහි පිහිටවූහ. මේ කර්මාන්ත ශාලා පිහිටුවීම නිසා රටට අවශ්‍ය භාණ්ඩ රාශියක් මෙහි නිපදවීමත් විශාල පිරිසකට රැකියා සැපයීමත් පිටරට වලට ඇදීගිය විශාල ධනයත් මේ රටෙහිම ඉතිරිවීමත් අතිශයින්ම වැදගත්ය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

<u>වගා සංග්‍රාමය;</u>

අප රටට සහල් පිටි සීනි ආදී ආහාර ද්‍රව්‍ය සැපයූ රටවලටත් පවා බලපෑ මහත් ආහාර අර්බුදයකට මුළු ලෝකයම මුහුණ පෑ අවස්ථාවෙහි අප රට තුළ වගා සංග්‍රාමයක් ආරම්භ කළ ගරු බණ්ඩාරනායක මැතිනිය රට පුරා තිබුණ පුඩු බිම් සියල්ලක්ම එලි පෙහෙළි කරවා වී, මුං, තල, ඉරිඟු ආදී ධාන්‍ය වර්ගත් කෙසෙල් මඤ්ඤොක්කා බතල ආදී ආහාරත් මිරිස් ලූණු අර්තාපල් ආදියත් සුලභ කළහ.

මේ කාලයේ ලෝකයේ සෑම රටකටම ආහාර අහේනියකට මුහුණ පාන්නට සිදුවූ අතර "ඉතියෝපියා" නම් රට බලවත් ලෙස ආහාර හිඟයෙන් පෙළෙන්නට විය. එම රටෙහි පාලකයා වූ "හේල්සිලාසි" නැමැති අධිරාජ්‍යයාට මෙම දුර්භික්ෂය නිසා සිහසුන පවා අත්හැර යන්නට සිදුවිය.

මේ දරුණු ආහාර හිඟය පැවති සමයේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය මෙරට වැසියන්ට ආහාර එවා ගන්නට කල්තියාම සෑම පහසුකමක්ම සැලසූ අතර නොමිලයේ හාල් සේරු භාගයක් සහ රුපියල් ½ ගණනේ සතියකට හාල් සේරු 2 ක් ලබා ගන්නට සියලු පහසුකම් සලසා දුන්හ.

එපමණක් නොව රජයට කෙතරම් මුදල් අමාරුකම් තිබුණත් මහජනයාට සත හැත්තෑ දෙකට (72 කට) සීනි රාත්තල බැගින් ලබා දීමටද ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමියට හැකිවිය.

<u>ගල් ඔය සීනි කොළඹට:</u>

ගල්ඔය ප්‍රදේශයෙහි අරඹා තිබුණ සීනි කර්මාන්තය උක් වගාව අඩපන වෙමින් කලක සිට ජාතික ධනය නාස්ති කිරීමක් බවට පත්ව තිබිණ.

ගරු බණ්ඩාරනායක මැතිණිය අග්‍රාමාත්‍ය ධුරයට පත් වූවාට පසු ගල්ඔය සීනි කර්මාන්තය දියුණු කොට කෙසේ හෝ කොළඹ වෙළඳ පොලට ප්‍රථම වරට විශාල සීනි තොගයක් ලැබෙන්නට සැලැස්සූහ.

<u>මහවැලි ජලය රජරටට;</u>

මහනුවර පොල්ගොල්ල නම් ස්ථානයේ සිට අනුරාධපුරයට මහවැලි ගඟේ ජලය ප්‍රථම වරට ලබා දුන්නේ ගරු බණ්ඩාරනායක මැතිනියයි.

1970 - 1977 යන වර්ෂ වල අග්‍රාමාත්‍ය ධුරය දරමින් ගරු අගමැතිනිය රජරට (අනුරාධපුරය) ගොවීන්ට වතුර ලබාදීම නිසාම සහලින් රට ස්වයංපෝෂිත වෙන්නටත් සහල් වෙනුවෙන් පිටරට වලට ඇදී ගිය විශාල ධනයක් ඉතුරුකර ගැනීමටත් හැකිවිය.

<u>පුවත්පත් කොමිෂම;</u>

මේ රටේ සාමාන්‍ය පොදු මහජනතාවගේ දියුණුවට බාධා කරමින් ශ්‍රීමත් බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමා ආරම්භ කළ සියලුම පොදුජන හිතකාමී කටයුතු වලට අකුල් හෙලමින් එතුමාගේ පාලනය අවුල් කිරීමට නැත් කරමින් බණ්ඩාරනායක රජය බිඳ හෙළීමට නොයෙකුත් කූටෝපක්‍රම යොදා බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමාගේ පෞද්ගලික සහ දේශපාලන ජීවිතයට මඩ ගසමින් සිංහලයත් බුද්ධාගමත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාත් පහත් තත්වයට ඇද දමමින් උපහාසාත්මක අපහාසාත්මක වැකි දිගට හරහට ප්‍රචාර කොට රටවාසීන් මුලාකල බේරේ ගෙදර පුවත් පත් මහජන සතු කොට පුවත් පත් මණ්ඩලයක් ආරම්භ කළේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි.

බෙරේ ගෙදර පුවත් පත් ආයතනය බිහිකල උතුම සිංහල බෞද්ධ වීර පුරුෂයාගේ බලාපොරොත්තු වලට හාත්පසින්ම විරුද්ධව සිංහල බෞද්ධ ප්‍රබෝධයටත් සාමාන්‍ය ජනතාවගේ නැඟී සිටීමටත් මේ පත්‍ර ආයතනය අකුල හෙලූහ.

අධිරාජ්‍යවාදී බලලෝභී ධනවත් අතලොස්සක් පමණ වූ ඥාති මිත්‍ර පිරිසකට සදහටම මේ රටේ සියලුම බලතල තහවුරු කර දීමටත් ඇප කැප ක්‍රියාකළ බෙරේ ගෙදර පුවත් පත් ආයතනය ජාතිය සතු කිරීමෙන් ගරු බණ්ඩාරනායක අගමැතිණිය මේ රටේ පොදු ජනතාවගේ දියුණුවට බාධකව තිබුණ මහත් බැම්මක් බිඳ හෙලූ බව කිව හැක.

<u>ශ්‍රී ලංකාවට සම්පූර්ණ දේශපාලන නිදහස ලබාදීම,</u>

1970 පැවැත්වූ මහා මැතිවරණයෙන් විශාල ජයග්‍රහනයක් (මුළු ලක්දිව පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාවෙන් 2/3 පංගුවක්) අත්පත් කරගත් අග්‍රාමාත්‍ය ගරු බණ්ඩාරනායක මැතිණිය මහජන පොරොන්දුවක් ඉෂ්ට කරමින් පූර්ණ නිදහස් ආණ්ඩුක්‍රම පණතක් සකස් කොට මහජනතාවගේ අදහස් විමසා බලා අංග සම්පූර්ණ කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කළහ.

මේ අනුව ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් නිදහස් රාජ්‍යයක් බවට පත්වූයේ 1972 මැයි 20 දාය. මෙතෙක් මේ රටේ බ්‍රිතාන්‍ය අන්ඩුවට ආණ්ඩුව අර්ධ යටත් භාවයකින් පැවතින.

එන්ගලන්ත ආණ්ඩුව වෙනුවෙන් එම රජයට මේ රට ගැන තොරතුරු සපයන (වාර්තා කරන) බලධරයෙක් හෙවත් අග්‍රාණ්ඩුකාරයා නැමති පුද්ගලයෙක් පත් කොට සිටියහ. යථෝක්ත අග්‍රාණ්ඩුකාරවරයා එන්ගලන්තයේ රැජින වෙනුවෙන් මේ රටේ පාලනය ගැන සෙවිල්ලෙන් සිටි සර්වබලධාරි පුද්ගලයාය.

මෙසේ වෙනත් රටක ආණ්ඩුවක් වගකිව යුතු රාජ්‍ය නායකයෙක් යම් රටක නායකත්වය දරනවා නම් ඒ රටට දේශපාලන නිදහසක් ඇතිබව ප්‍රකාශ කිරීම මහා බොරුවකි.

එපමණක් නොව කිසියම් රටක අගමැති මැති ඇමතිවරු සහ රජයේ සේවකයන් වෙනත් මහ රටක ආණ්ඩුවකට - රැජිනකට යටත්ව සේවය කරන බවට දිවුරුම දීමද රටක යටත් භාවය ප්‍රකාශ වීමකි.

1948 දී ලංකාවට දේශපාලන නිදහස් ලැබුණාය කියා ඉතා ඉහලින් දොඩවනක් උත්සව කරතත් මේ රට පාලනයට හවුල්වන අය මෙතෙක් කල් 1972 මැයි 22 වෙනි දින වනතුරු දිවුරුම් දුන්නේත් බ්‍රිතාන්‍ය රජයට සහ රැජිනට යටත්ව සේවය කරන බව කියමින්ය.

1972 මැයි 22 වෙනි දින ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය වරිය ශ්‍රී ලංකා වාසින්ට අංග සම්පූර්ණ දේශපාලන නිදහස ලබා දෙමින් ශ්‍රී ලංකා සමාජවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම පනත සම්මත කළහ.

ශ්‍රී ලංකාව ඉංග්‍රීසි ආන්ඩුවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරගත්තේ ගරු බන්ඩාරණායක මැතිණියයි.

ලංකා ඉතිහාසයේ රන්වන් අකුරු වලින් ලියවෙන අලුත් පිටුවක ගරු බන්ඩාරනායක මැතිණියගේ රජය විසින් ඇති කිරීම මේ සියවසේ මේ රටේ සිදුවූ ඉතාමත්ම උතුමවූත් වැදගත්වූත් සිද්ධියයි.

## සිරිමා ශාස්ත්‍රි ගිවිසුම:

ඉංග්‍රීසි කාරයන් මේ රට පාලනය කළ කාලයේ දකුණු ඉන්දියාවෙන් මේ රටට ගෙන්වන ලද දැනට දශ ලක්ෂයකට අධික ද්‍රවිඩ කම්කරු පිරිසක් මේ රටේ සිටිති.

ලංකාවේ පුරවැසියන් නොවූ මෙම ද්‍රවිඩ වතු කම්කරු ජනයා ආපසු ඉන්දියාවට යැවීම ගැන 1948 දී ජනයා නිදහස ලබාගත්තායයි කියන අය අමතක කලා පමණක් නොව මේ රටට බරපතල ප්‍රශ්ණයක් වූ එම ද්‍රවිඩයන්ට කුමක් කල යුතුද මේ ප්‍රශ්ණය කෙසේ විසඳිය යුතුද කියා සිතන්නට පවා එම 1948 ලැබුණාය කියන නිදහස් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සකස් කළ අයට බැරිවීය.

1948 සිට 1960 වන තුරු මේ රටේ අගමැතිකම් කළ පුද්ගලයන් පස් දෙනාටම මේ ඉන්දියන් ද්‍රවිඩයන්ගේ ප්‍රශ්ණය විසඳන්නට බැරිවිය 1960 දී අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ භාරගත් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ඉන්දියාවට ගොස් එහි ආණ්ඩුව සමග යුහදව සාකච්ඡා කොට ලංකාවේ සිටින ඉන්දිය ද්‍රවිඩයන් ආපසු ඉන්දියාවට යැවීමට තිරණය කොට ''සිරිමා ශාස්ත්‍රි'' ගිවිසුම අත්සන් කළහ.

## කච්චතිව් දූපත:

ලංකාවත් ඉන්දියාවත් අතර පිහිටා ඇති කච්චතිව් දිවයින අතීතයෙහි ලංකාවට අයත්වූවකි. බ්‍රිතාන්‍යයන්ට මේ රට යටත්ව තිබුණ කාලයේ එම දූපත අපට අහිමි විය. ඉන්දියාවද එම දිවයිනට අයිතිවාසිකම් කියන්නට විය.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමිය ඉන්දිය රජය සමග සාකච්ඡා කොට කච්චතිව් දිවයින නැවත ලංකාවට ලබාගත්හ.

## මුහුදුසීමා සම්මත කිරීම:

ශ්‍රී ලංකාව වටේටම මහා සමුද්‍රය පිහිටා ඇතත් මුහුදෙන් අප රටට එකල ලබාගත හැකි වූයේ ස්වල්ප ලාභයකි. වෙනත් රටවල් ලංකාව වටා ඇති මුහුදෙන් විශාල වාසි ලබා ගත්හ

ලෝකයේ මහා බලවතුන්ගේ යුද්ධ නැව් පවා ලංකාව අවට මුහුදේ රඳවා තිබිණ. මෙයින් අපේ ආරක්ෂාවට මහත් තර්ජනයක් ද එල්ල වී තිබිණ

රටේ ආරක්ෂාවත් මුහුදෙන් ලබා ගත හැකි විශාල ලාභ ප්‍රයෝජනත් ගැන කල්පනා කල ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැති තුමිය ලංකාව වටා ඇති මුහුද නාවුක යැතපුම් 200 ක් අපට අයිතිවන ලෙස නිති සම්මත කොට එම නිති මාලාව ලොව සියලුම රටවලට යැවූහ. (දැනට) මින්පසු ලංකාවට අයිති මුහුදෙහි කිසිම විදේශ මුහුදු යාත්‍රාවක් අපෙන් අවසරයක් නැත්ව රඳවා තැබීම අපට අයත් කොටසට ඇතුල්වීම තහනම්ය.

විජය කුමරු මෙරටට පැමිණ සිංහලයන්ට මේ රට අයත් කරගත්තාට පසු ප්‍රථම වරට මේ රටට මුහුද මෙපමණ අයිතිවිය යුතුයයි නිති ගත කලේ ගරු අගමැතිණියයි.

මෙය ලෝකයේ සියලුම රටවල් පිළිගෙන ඇත. මින්පසු අපට අයිති මුහුදට අපෙන් අවසරයක් නැතිව කිසිම නැවකට ඇතුල් විය නොහැකිවා පමණක් නොව අපේ මුහුදෙහි වෙනත් අයගේ මුහුදු පරීක්ෂණ හෝ මසුන් ඇල්ලීමද තහනම් වේ. මේ නිසා අප රටට අවුරුදු පතා විශාල ධනයක් ද ලැබේ.

**පූජා නගර**

අනුරාධපුරය, කැළණිය, කතරගම, මහනුවර යන ප්‍රධාන පූජා නගර බවට පත් කිරීමේ නීති රීති සකස් කොට එම පෞරාණික බෞද්ධ භූමි නැවත වරක් පෙර තිබුණු උසස් තත්වයට පත් කිරීමත් ඒවා ආරක්‍ෂා කිරීමෙත් කටයුතු ප්‍රථම වරට මේ යුගයේ ආරම්භ කළේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණියය.

**ජනාධිපති ධූරය:**

ලංකාවෙහි ප්‍රථම වරට ''ජනාධිපති ධූරයක් ඇති කළේත්, පත් කළේත්'' ගරු බණ්ඩාරණායක අග්‍රාමාත්‍යවරියගේ රජය විසින්ය.

තමන්ම ජනාධිපති පුටුවට පස්ස දෙමරන් පිංගා ගැනීමට එතුමිය සිතුවේ නැත. ඊට යුදුසු පක්ෂ දේශපාලනයට සම්බන්ධ නැති උතුම් පුරුෂයෙක් ප්‍රථම වරට ලංකාවේ ජනාධිපති ධුරයට පත්විය. මේ උසස් තනතුරට පළමුවෙන් පත්වූයේ ශ්‍රීමත් විලියම් ගොපල්ලව උතුමාණෝය. එතුමා උතුම් නම් ආරූඪ කර ගත්තේ නැත. කිසි විටෙක බොරු කිවේ නැත. කිසිම දේශපාලන පක්ෂයකට බැඳී සිටියේ නැත. තමන්ට වඩා ක්‍රියාශීලීව දක්ෂ බුද්ධිමත් ජනප්‍රිය දේශපාලඥයන් ඝාතනය කරවීමට කුමන්ත්‍රණ කළේද නැත. තමන්ට වඩා ලෝක ප්‍රසිද්ධියට පත් රටේ අනාගතය පිළිබඳ වැදගත් වැඩ රාශියක් කළ ශ්‍රේෂ්ඨ තත්වයට පත්වූ අයට මඩ ගසා දේශපාලනයෙන් ඉවත් කිරීමට ගොපල්ලව උතුමා සිතුවේ නැත.

රටේ ජාතියේ ගෞරවය කීර්තිය රැක දුන් උසස් වංශවත් අයට ඒ උතුම් ගොපල්ලව ජනාධිපති තුමා කිසි විටෙක අපහාස එන ලෙස රට දෙවනත් කරමින් බෙරිහන් දීමට ජාතික ගුවන් විදුලිය කිසිවිටෙක යොදා ගත්තේ නැත. මෙම නිහතමානී චාම් බෞද්ධ ජනනායක උතුම් ගොපල්ලව ජනාධිපතිවරයා පත් කරනු ලැබුවේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිවරියගේ රජය විසින්ය.

**ඉඩම් කොමිසම;**

රටේ වැවුන ඉඩම් වලින් වැඩි කොටස අයිතිකරගෙන සිටියේ දේශීය සහ විදේශීය ධනවතුන් ටික දෙනෙකි.

මධ්‍යම ලංකාවේ (උඩරට) වතුකරය නිසා අසරණ ගම්වැසියෝ නොයෙක් තාඩන පීඩන වලට ගොදුරු වී සිටියහ. වතුකරය අතර හිරවී තිබුණ කුඩා ගමකට යන්න එන්න පාරක් පවා සාදගැනීමට නොහැකිව තිබුණි.

දේශීය සහ විදේශීය ධනවතුන් අක්කර ලක්ෂ ගණනක් අයිතිකර ගෙන සිටියදී නිවහනක් තනා ගැනීමට තරම් වත් ඉඩම් කැබැල්ලක් නැති මේ රටේ පුරවැසි ලක්ෂ සංඛ්‍යාත පිරිසක් කුලී නිවස් වල දුකසේ දිවි ගෙවමින් සිටියහ.

මෙම අසාධාරණය නැතිකර දැම්මට කල්පනා කළ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය ඉඩම් කොමිසමක් පත්කොට මෙරට සහ පිටරට වල සිටි මෙහි ඉඩම් හිමියන් සමග සාකච්ඡාකොට ස්වදේශිය සහ විදේශිය සියලුම කොම්පැණි ඉඩම් (සමාගම් වලට අයිති) සහ පෞද්ගලිකව තිබුණ විශාළ ඉඩම් ජනසතු කරමින් නීති සම්මත කළහ.

මෙරට එක් පුරවැසියකුට ඉඩම් අක්කර 50 කට වඩා අයිති නොවන

හැටියට නීති සකස් කළහ.

අවුරුදු සිය ගනනක සිට මේ රටේ වටිනා ඉඩම් වලින් අක්කර ලක්ෂ ගණනක් අයිතිකර ගෙන සිටි විදේශිකයන් සහ ස්වදේශික ධනවතුන් මෙම ඉඩම්වල තේ. පොල් රබර් ආදි (වානිජ) වැවිලි කරගෙන එයින් ලැබෙන විශාල ආදායම් තමන්ගේ රටවලට (විදේශවලට) ගෙන ගියහ.

මේ විධියට අප රටේ ප්‍රධාන ආදායම් මාර්ග විදේශිකයන් අත දිගින් දිගටම රැඳී තිබීම මේ රටේ දියුණුවට මහත් බාධාවක් විය.

ගරු අගමැතිණිය මෙරට ජනතාවගේ අනාගත සුභ සිද්ධිය සලකා මහා වතුයාය වල් වලින් ලැබෙන ධනස්කන්ධය ලංකාවෙහි සංවර්ධනයට ලැබෙන ලෙස වතු ජනසතු කළාය.

<u>ඉන්දීය සාගරය සාම කලාපයක් කිරීම:</u>

ලංකාව වටා පිහිටි මහා සාගරය (ඉන්දීය සාගරය) තුල යුද්ධ නැව් රඳවා තබා ගන්නට කිසිම රටකට ඉඩ නොලැබෙන ලෙස සාමකාමී ප්‍රදේශයක් වශයෙන් පැවතිය යුතුයයි ගරු අගමැතිණී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එක්සත් ජාතීන්ගේ මහා සංවිධානයට යෝජනාවක් ඉදිරිපත් කළාය.

මේ යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ලාංකික ජනතාව යුද්ධබියෙන් තොරව ජීවත් කරවීම බව පැහැදිලිය.

ලෝකයේ අධිරාජ්‍යවාදී සහ සමාජවාදී යන මහා බල කඳවුරු (කණ්ඩායම්) දෙකට වහල් වී නොවැති මධ්‍යස්ථ ජාතීන්ගේ මහා සම්මේලනයේදී (නොබැඳි ජාතීන්ගේ සංගමයේ) පුරෝගාමීන් වශයෙන් දිවංගත බණ්ඩාරනායක උතුමාණන් එදා එඩිතරව ක්‍රියා කළහ.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය යථෝක්ත මධ්‍යස්ථ ජාතීන්ගේ මහා සංගමයේ සභාපතිණිය වශයෙන් විශ්ව කීර්තියට පත් වූ බවත් 1976 වර්ෂයේදී මධ්‍යස්ථ ජාතීන්ගේ රාජ්‍ය නායකයන්ගේ පස් (5) වැනි මහා සම්මේලනය කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ බවත් මෙහිලා සඳහන් කළ යුතුය.

මුළු ලෝකයේ ජනගහණයෙන් 2/3 පංගුවක් පමණ අයත් වන මේ මහා නොබැඳි ජාතීන්ගේ සමුළුවෙහි ගරු සභාපති ධුරයට ගරු බණ්ඩාරනායක අගමැතිණිය පත්වීමෙන් මුළු ලෝක ප්‍රධාන පාලක (අගරජින) ධුරය ලැබූහ.

එපමණක් නොව ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය විසිවන සිය වසේ මේ රටේ බිහිවූ අග්‍ර ගන්‍ය උත්තමාව බවට පත් වූවාය. මෙ රටට එතුමිය නිසා අත්වූ ගෞරවය ඉතා විශාලය.

<u>චීන ඉන්දීය දේශ සීමා ගැටුම සමදාන කිරීම:</u>

චීනයත් ඉන්දියාවත් අතර තිබෙන එක්තරා භූමි භාගයක් නිසා මේ මහා රටවල් දෙක අතර දේශ සීමා අරගලයක් උද්ගතවී දෙරටම බිහිසුණු සටනකට සූදානම් වෙද්දී දිනෙන් දිනම සටන ඇවිලී යද්දී ලොව මහා ජාතීන්ට මෙහෝ මහ ජාතික සංගමයට එය සමථයකට පත් කරන්නට නොහැකි වී පවතිද්දීත් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එහා ඉදිරිපත් වී දෙරටේම නායකයන් හමුවී සුහදව සාකච්ඡා කොට සිදුවෙන්නට ගිය මහා සටන නවත්වා සමාදාන කළහ. මෙයින් ගරු අගමැතිනිය ජාත්‍යන්තර බුද්ධිමත් දේශපාලන නායිකාවක් බවට පත්වූවා පමණක් නොව ශ්‍රී ලංකාවට මහත් ගෞරවයක්ද ලබා දුන්හ.

## 1970 - 1977

1970 මහා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගරු බණ්ඩාරනායක මැතිණියගේ නායකත්වයෙන් විශාල ජයග්‍රහනයක් අත්පත් කර ගත්හ. මුළු පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාවෙන් 2/3 කට වඩා ලබාගෙන තිබිණ.

මේ ජයග්‍රහනය නිසා එතෙක් අප රට පාලනය කල අර්ධ වහල් සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම අස්කර දැමීමටත් අළුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමටත් හැකි විය. 1965 - 1970 අතර කාලයේ රට පාලනය කල එක්සත් ජාතික පක්ෂය විශ්ව විද්‍යාලය වලින් උපාධි ලබා පිටවූ උගතුන්ට රජයේ රැකියා දීම සම්පූර්ණයෙන්ම පැහැර හැර තිබුණ නිසා 12000 කට වඩා උපාධිධාරීන්ට රැකියා සැපයීමට හැකිවූයේ 1970 දී බලයට පත් බණ්ඩාරනායක මැතිණියගේ රජයටයි. මේ ප්‍රශ්නය මැතිණියගේ රජය විසින් විසඳගෙන යද්දී විශාල පිරිසකට රැකියා ලබා දී තිබෙද්දීත් මැතිණියගේ රජය අඩපන කිරීමට මාන බලමින් සිටි දේශීය සහ විදේශීය අධිරාජ්‍යවාදී සහ ධනවාදී රැකියා විරහිත තරුණ තරුණියන්ට මුදල් - කෑම - වාහන ආදිය රහසිගතව සපයා දෙමින් එම පිරිස නොයෙක් විෂ මත් ද්‍රව්‍ය වලින් නොමග යවා රජයට විරුද්ධව කැරැල්ලක් (කෝලාහලයක්) ඇති කලහ.

ගරු අගමැතිණියගේ ස්ථානෝචිත ප්‍රඥාව නිසා කැරැල්ල වැඩි පැවැත්වීමට හැකිවිය.

මේ කැරැල්ල නිසා රටට විශාල පාඩු සිදුවිය. නොමග ගිය තරුණ ජීවිත රාශියක් විනාශ විය. කෝටි ගණනක දේපල විනාශ විය.

මෙම ත්‍රස්තවාදී කැරැල්ල ඇති කිරීමට සෑම පරිශ්‍රමයක්ම දැරුවේ රටේ බලතල ගිලගෙන සිට පරාජයට පත්වූ බල ලෝභීන්ය.

මෙම ත්‍රස්තවාදීන් පිළිබඳව සානුකම්පිත ලෙස ක්‍රියාකල ගරු අගමැතිනිය නොමග ගිය තරුණ තරුණියන්ට සමාව දුන්හ. ඔවුන් පුනරුත්ථාපනය කිරීමටද රජයෙන් විශාල මුදලක් වැයකලහ.

සාධාරණ නඩු විභාග වලින් පසු කැරලි කරුවන් කිප දෙනෙක් සිරයට ගියහ.

මෙරට පැන නැගුණ ත්‍රස්තවාදී කැරැල්ල මර්ධනය කළ දක්ෂතාව දුටු ලොව මහා රාජ්‍යවල ජනනායකයෝ පවා ගරු අගමැතිණියට ප්‍රශංසා කළහ.

### වාමාංශික පක්ෂ ශ්‍රී: ල: නි: ප: පක්ෂයට සම්බන්ධ කර ගැනීම:

අවුරුදු තිස්පහක පමණ කාලයක් මේ රටේ වාමාංශික දේශපාලන පක්ෂ ආරම්භ කොට රටේ පාලන බලය අත්පත් කරගත නොහැකිව ඔවුනොවුන් භේද භින්න වෙමින් අතරමංවී සිටි අවස්ථාවක 1956 වර්ෂයේ අගමැති ධූරයට පත්වූ ශ්‍රීමත් අතිගරු එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරණායක උතුමාණන් තම ඇමති මණ්ඩලයට වාමාංශික නායකයන් දෙදෙනෙක් ඇතුලත් කර ගත්හ. මේ සම්බන්ධය නිසා අගමැතිතුමාට ඉතා බැරෑරුම් අවස්ථාවකට මුහුණ පාන්නට සිදුවූවා පමණක් නොව එතුමාගේ ජීවිතය විනාශ වීමට යථෝක්ත දේශපාලන හවුල බොහෝ දුරට බලපෑ බවද, ඇතැම් වාමාංශික නායකයන්ගේ ප්‍රකාශ වලින්ම පැහැදිලි විය.

ඊට පසු 1970 වර්ෂයේ අග්‍රාමාත්‍ය පදවියට පත්වූ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ඇමති මණ්ඩලයටද වාමාංශික පක්ෂ කිපයක නායකයන් කිප දෙනෙක් ඇතුලත් කරගනු ලැබූහ. වැඩි කලක් යන්නට ප්‍රථම මේ හවුලෙන්ද ගරු අගමැතිණියගේ රජය තුල අර්බුද ඇතිවෙන්නට විය. රජයේ

නියමිත ආයුෂ ඉක්මයන්නටත් පෙර වාමාංශික ඇමතිවරු ඇමති මණ්ඩලයෙන් සහ රජයෙන් ඉවත්වී 1977 දී පැවැත්වූ මහ මැතිවරණ සමයේදී ගරු අගමැතිනියටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් නිර්දය ලෙස වාක් ප්‍රහාර එල්ල කළහ.

එම වාමාංශික පක්ෂ හා නායකයනුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පක්ෂ නායකත්වයත් රටේ සමාජවාදී ඉදිරිගමනත් විනාශකර ලීමට - අනුගා දැමීමට මුස්න අතේ තියාගෙන සිටි අධිරාජ්‍යවාදී ධනවාදී පක්ෂයත් සිව දිගින්ම ඇදු හැලූ පොකුරු බොරු බෙගල් වලට රැවටුණු මහජනතාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දයෙන් පරාජයට පත් කළහ.

එපමණකින් නොනැවතුණු අධිරාජ්‍යවාදීහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ භේද ඇතිකළහ. ඇතැම් ශ්‍රී. ල. නි. පක්ෂ උප නායකයන්ට මහායෙක් තාන්න මාන්න දෙනබව අඟවා පක්ෂ නායිකාව අයින් කර තැබීමට කුමන්ත්‍රණ කළහ, එතුමියගේ ප්‍රජා අයිතිය නැති කිරීමට අලුත් නීති අලුත් උසාවි පත් කළහ.

ශ්‍රී. ල. නි. පක්ෂ නායිකාව මරා දැමීමට වරක් කුමන්ත්‍රනය කොට දඬුවම් ලැබුවන්ට පාලන තන්ත්‍රය තුල උසස් තිලනල දී පක්ෂ නායිකාවත් පක්ෂයත් මරා දැමීමට කළ හැකි කිය හැකි සියලුම දෙමල් කළහ. කිහ.

නමුත් අද මහජනතාවට ශ්‍රී. ල නි. පක්ෂය අවශ්‍ය වී ඇත. මෙම රට දැනට වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩ ගැනීමට නම් ශ්‍රී. ල. නි. පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව බුද්ධිමත් ජනතාව කල්පනා කරති. මේ නිසා ශ්‍රී. ල. නි. පක්ෂය නැවත ගොඩනංවා පාලන බලය පවරා දීම මෙරට පොදු මහජනතාවගේ භාග්‍යයක් බව කිව යුතුය.

පසුගිය දස වසර තුළ මේ රටේ සිදුවී ඇති විපත මෙහිලා විස්තර කළ නොහැකි තරම්ය. මේ දරුණු තත්වයෙන් ශ්‍රී ලංකාවත් මෙරට වැසි ජනතාවත් රැක ගැනීමට විනාශ වී ගිය රට නැවත ගොඩනැංවීමට සමත් එකම පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බවත් පක්ෂ නායිකා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ජනාධිපති පදවියට අතිශයින්ම සුදුසු එකම වීරෝදාර මාතාව බවත් අද මුළු මහත් ලංකාවාසී ජනතාවම එක හෙළා පිළිගෙන ඇත.

"හිමිකම් ඇවිරිණි"

—නිමි.—

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
ලේඛනාගාරය

විමසන්න:-

- සියලුම ජ්‍යොතිෂ කටයුතු ගැණ
- ස්තුති පත්‍ර සෑදීම
- නැකැත් පත්‍ර සෑදීම
- සෙත් කවි
- වස් කවි
- සෝක ප්‍රකාශ

ලියුම;-

**එස්. ජී. සහබන්දු (බී. ඒ.) මහතා**

176/A, එළියට පාර,

ගාල්ල.

මුද්‍රණ වියදම 4/25

ගාල්ලේ ගිංතොට සුනිල් පෙරේරා වික්‍රමසිංහ වන මා විසින් ගාලු ශ්‍රී ලං: නි: ප; මධ්‍ය සංවිධානය වෙනුවෙන් ගාල්ලේ ශ්‍රීපාලි ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.